# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1863/24 - 2014 මැයි මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2014.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි අධිකාරය)**

මගේ අංකය : 4/3/1(පත්කිරීම් - අත්කරගැනීම්)

460 වන අධිකාරය මත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2) අ වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් නියෝගය මෙයින් නියම කරමි.

නියෝග අංක 2014/5 - පත්කිරීම්

ඉඩම් අත්කර ගැනීමේ රාජකාරි සඳහා I උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශය තුළ II වන උපලේඛනයේ දක්වා ඇති නිලධාරින් III වන උපලේඛනයේ සඳහන් කාලසීමාව දක්වා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ කාර්ය සඳහා නියමිත නිලධාරියකු ලෙස මෙයින් නියම කරනු ලැබේ.

| *I වන උපලේඛනය* | *II වන උපලේඛනය* | *III වන උපලේඛනය* |
|---|---|---|
| *බල ප්‍රදේශය පරිපාලන දිස්ත්‍රික්කය* | *නිලධාරියාගේ නම* | *කාලසීමාව* |
| 1. යාපනය | ඩබ්.වරාගොඩ මයා (විශ්‍රාමික - ශ්‍රී ලංකා පරිපාලන සේවය - I) | 2014.04.07 දින සිට 2015.04.06 දින දක්වා |
| 2. කිලිනොච්චි සහ මුලතිව් | එම්. එම්. තිලකරත්න මයා (විශ්‍රාමික - ශ්‍රී ලංකා පරිපාලන සේවය) | 2014.04.07 දින සිට 2015.04.06 දින දක්වා |
| 3. ත්‍රිකුණාමලය | නල්ලයියා කනපතිපිල්ලේ මයා (විශ්‍රාමික සහකාර ඉඩම් කොමසාරිස් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන) | 2014.04.07 දින සිට 2015.04.06 දින දක්වා |

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.
2014, මැයි මස 13 වැනි දින.

06 - 127/1


1A - G 19584 — 100 (2014/05)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි අධිකාරය)**

මගේ අංකය : 4/3/1(පත්කිරීම් - අත්කරගැනීම්)

460 වන අධිකාරය මත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2) අ වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් නියෝගය මෙයින් නියම කරමි.

නියෝග අංක 2014/4 - පත්කිරීම්

මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මාතර, හම්බන්තොට, මහනුවර සහ කුරුණෑගල යන පරිපාලන දිස්ත්‍රික්කයන්හි දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සහ උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වල ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම පිණිස I උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශය තුල II වන උපලේඛනයේ දක්වා ඇති නිලධාරීන් III වන උපලේඛනයේ දක්වා ඇති කාලසීමාව දක්වා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ කාර්ය සඳහා නියමිත නිලධාරියකු ලෙස මෙයින් නියම කරනු ලැබේ.

| *I වන උපලේඛනය* | *II වන උපලේඛනය* | *III වන උපලේඛනය* |
|---|---|---|
| *බල ප්‍රදේශය පරිපාලන දිස්ත්‍රික්කය* | *නිලධාරියාගේ නම* | *කාලසීමාව* |
| 1. මාතර, හම්බන්තොට | ටී. කන්කානම්ගේ මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශ්‍රාමික) | 2014.03.01 දින සිට නැවත නියමයක් කරන තුරු |
| 2. මහනුවර, කුරුණෑගල | බී. ජී. එච්. එච්. සුගතදාස මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශ්‍රාමික) | 2014.03.01 දින සිට නැවත නියමයක් කරන තුරු |

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.
2014, මැයි මස 13 වැනි දින.

06 - 127/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.